ගම්පොල නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ගම්පොල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු රු.1,187,398ක් වූ පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අම්බුළුවාව හරිත මංතීරුව ඉදිකිරීම ව්‍යාපෘතිය 2017 වර්ෂයට අවිච්ඡේද කර නොතිබියදී ණයගැතියෝ හා ණයහිමියෝ ලෙස රු.2,098,130 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු රු.681,573ක් වර්ෂයේ ආදායමට හා හිඟ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ගබඩා ණයහිමි හා සැපයුම්කරුවන්ට කලින් ගෙවීම් රු.193,745 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සභාව සතුව පැවති ට්‍රැක්ටර් ට්‍රේලර රථ 2 ක වටිනාකම වූ රු.519,800 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල් ශේෂය රු.95,300,300 ක් වුවත්, එය රු.95,228,800 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.71,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ගම්පොල නිදහස් මාවත ඇවිදින මංතීරුව ව්‍යාපෘතියේ කර්මාන්ත ණයගැති ශේෂය රු.676,898 ක් වුවත්, එය රු.761,640 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රු.84,742 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.169,268,245 ක් වූ ගිණුම් ශේෂ 6 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.9,072,877 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.122,208,607 ක්වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.115,916,010 ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.18,370,876 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල වටිනාකම රු.10,748,430 ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.47,767,329 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i)මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහනයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 189 | 2004, 2013 වර්ෂවල ලැබී තිබුණු රු.569,500 ක් වටිනාකම වූ චෙක්පත් 29 ක් අගරු වී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | අංක ආර්ඩී/1/4/5/43 හා 2010 පෙබරවාරි මස 03 දිනැති ජනාධිපති ලේකම්ගේ රජයේ ඉඩම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය 3.5 ඡේදය හා නගර සභා පනතේ 36 (ඉ) (ii) ඡේදය | සභා තීරණ මත ඉඩම් බැහැර කිරීමට කටයුතු කර තිබුණු අතර, එකී ඉඩම් රජයේ තක්සේරුවකින් තොරව බදු දී තිබුණි. |
| (ඇ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන ජාතික පරිසර පනත හා අංක 1533/6 හා 2008 ජනවාරි 25 දිනැති ගැසට් පත්‍රය | ව්‍යාපාර ආයතන 13 කින් පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,130,179 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,951,836 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,117,834 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,117,834 ක වර්ධනයට කුලී ආදායම් රු.6,924,632 ක්, වෙනත් ආදයම් රු.19,741,856 ක වැඩිවීම හා ප්‍රවාහන සම්බන්ධතා වියදම රු.3,289,149ක් හා පොළී වියදම රු.5,772,307 ක වැඩිවීම මූලික වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
---------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය 6.5:1 සහ 6.6:6 ක් විය.

2.4 ආදායම් පරිපාලනය
-----------------------

2.4.1 වරිපනම්
-----------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.48,011,842 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අය කර තිබුණේ රු.14,908,427 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 31 ක අගයක් විය. වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම් සියයට 65 ක් වූ අතර, දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් හිඟය රු.44,311,339 ක් විය.

(ආ) වරිපනම් හිඟය වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතියද නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 5 කට වරක් සභා දේපළ තක්සේරු කළ යුතු වුවත්, 2008 වර්ෂයේ තක්සේරුව මත 2016 වර්ෂයේදී ද වරිපනම් බදු අය කර තිබුණි. 2008 සිට මේ වන විට බල ප්‍රදේශය විශාල වශයෙන් දියුණු වී තිබුණද, දේපළ තක්සේරු කර වරිපනම් බදු අළුත් නොකිරීම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

### 2.4.2 බදුකුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.12,309,348 ක කඩකුලී ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.3,076,520 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 24 ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී ශේෂය රු.10,578,459 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ඉක්මවූ රු.8,138,223 ක ශේෂයක් විය.

### 2.4.3 වෙනත් ආදායම්

(අ) විනෝද බදු

වර්ෂ ගණනාවක සිට පැවත එන රු.17,925 ක විනෝද බදු හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තානායම් ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි තානායම් ගාස්තු ශේෂය රු.1,039,357 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයකට පෙර සිට පැවත එන ශේෂය රු.13,889 ක් විය.

(ඇ) පොදු වැසිකිළි ගාස්තු

වසර කීපයකට සිට ඉදිරියට ගෙන එන පොදු වැසිකිළි ගාස්තු ශේෂය රු.1,373,457 ක් වූ අතර, එම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,511,263 ක් හා මුද්දර ගාස්තු රු.39,927,854ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 166 කින් සමන්විත වේ. ඉන් කඩ කාමර 48ක් ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් වසර 10 ක් ගතවී තිබුණද බදු දීමට නොහැකි වී තිබුණු අතර, බදු දුන් කඩ කාමර 118 ක් 2006 වර්ෂයේ සිට ව්‍යාපාර කරගෙන යෑමෙන් තොරව වසා දමා තිබුණි.

(ආ) නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් ඉහල නැංවීම නගර සභාවකින් ඉටු විය යුතු වගකීමක් වුවද, කාණු පද්ධති පිරිසිදු කිරීම, කුණු කසල ඉවත් කර නගර පිරිසිදුව තබා ගැනීම වැනි කටයුතු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවකට පෙර සිට විදුලි බල මණ්ඩලයට පවරා දී ඇති වත්කම් සඳහා ලැබිය යුතු රු.42,063,401 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 පෙබරවාරි 10 දින වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් රු.188,179 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඇතත්,එම මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය වී නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගෙන් අයකර තිබුණු රු.361,485 ක ණය වාරික හා පොලී වර්ෂයකට වැඩි කාලයක් ගෙවීමට කටයුතු නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ඈ) ගම්පොළ නගරයේ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයකින් අනුමැතිය ලබාගෙන, දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ගයට ඉහලින් නීති, රීති, වලින් බැහැරව කඩ කාමර ඉදි කිරීම සඳහා පෞද්ගලික සමාගමක් තෝරාගෙන 1998 දෙසැම්බර් 24 දින බදු දී තිබුණි. මෙම වෙළඳ සංකීර්ණය ඉදිකළ පසු සභා තීරණයක් මත කඩකාමර වලින් මසකට රු.250ක් හා රු.100ක් බැගින් අයකර ගැනීමට ගිවිසගෙන තිබුණද, 2005 වර්ෂයේ සිට 2016 සැප්තැම්බර් දක්වා රු.6,981,344 ක කුලී මුදලක් නගර සභාවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දුම්රිය මාර්ගයට ඉහළින් ඇති දුම්රිය රක්ෂිතය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගිවිසුමකින් තොරව දීර්ඝ කාලීන බද්දට ලබා දී තිබුණු අතර, 2000 සිට 2011 දක්වා රු.3,627,214 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩල හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ පරීක්ෂාවේදී සෞඛ්‍ය තනතුරු 32 ක අතිරික්තයක් පැවතුණ අතර, අතිරික්ත කම්කරුවන් 10 දෙනෙකු

කාර්යාලයේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. ගණකාධිකාරී, සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු, කළමනාකරණ සහකාර තනතුරු 01ක ද, රියදුරු තනතුරු 03 ක හා විදුලි කාර්මික තනතුරු පුරප්පාඩුව පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මාළුකඩ බදු දීමේදී එකවර අයකර ගතයුතු (key money) රු.5,310,667 ක මුදල අයකර ගෙන කඩ කාමර බදු දිය යුතු වුවත්, එම මුදල් වාරික 60 කින් ගෙවීමට ඉඩ සලසා දී තිබුණි.

(ආ) නගර සභාව සතු ඉඩම් බදු දීම්වලට අදාලව බදුකරුවන් 27 දෙනෙකුගෙන් රු.7,456,742ක තක්සේරු මුදලක් 2016 දෙසැම්බර් 31 දින වන විට ද අය කර ගෙන නොතිබුණි.

(ඇ) 2016 ඔක්තෝබර් 03 දින වන විට ඉඩම් බදුකරුවන් 125 දෙනෙකුගෙන් රු.2,192,106ක වාර්ෂික බදු කුලිය අයවිය යුතුව තිබුණ ද මෙම මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු ඉඩමක ඉදිකර තිබුණු නීතිඥ සංකීර්ණයෙන් අයවිය යුතු කුලිය රු.239,916ක් අයකරගෙන නොතිබුණි.

(ඉ) මස්කඩ බදු දීම වෙනුවෙන් දීර්ඝ කාලීනව පවතින රු.687,405 ක හිඟය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ගම්පොල පොදු වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර වල එකවර ගෙවන ටෙන්ඩර් මුදල් අය නොකර කඩ කාමර ව්‍යාපාරික කටයුතු කිරීමට ඉඩ සලසාදීම හේතුවෙන් 2016 ඔක්තෝබර් 02 වන විට රු.73,817,609 ක ටෙන්ඩර් මුදලක් අය විය යුතුව පැවතුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

සභාව සතු රු.4,612,270 ක වටිනාකම වූ යන්ත්‍ර සූත්‍ර 2 ක් හා වාහන 3 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

3.5 හඳුනාගත් අලාභ

-------------------

සභාව සතු අංක LL - 7044 දරන ලොරි රථය 2016 මැයි 18 දින රාත්‍රියේ අනතුරට පත් වී තිබුණි. වාහන අනතුරින් පසු සිදු කළ මු.රෙ.104 (3) අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව අනුව රියදුරුගේ නොසැලකිල්ලෙන් මෙම අනතුර සිදු වී තිබූ බවත්, ඉන්ද්‍රා ට්‍රේඩර්ස් ආයතනයෙන් ලබාගෙන තිබූ අළුත්වැඩියාව සම්බන්ධ ඇස්තමේන්තුව අනුව රු.211,340 ක අලාභයක් සභාවට සිදු වී තිබුණි.

3.6 සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ දෛනිකව මෙට්‍රික් ටොන් 20 කට ආසන්න කසළ ප්‍රමාණයක් එකතුවන අතර, එම කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි. එකතුවන කැලි කසළ අම්බුළුවාවේ ජෛව විවිධත්ව සංකීර්ණයට බැහැර කර පස් දමා වැසීම සිදුකර තිබුණි. 2016 වර්ෂයේදී කසළ දැමූ ස්ථානය නාය යාම හේතුවෙන් කසළ හා පස් ඉවත් කිරීමට රු.6,328,810 ක මුදලක් වැයවී තිබුණි. ඒ අනුව ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමෙන් තොරව පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි.

(ආ) නගර සභාව විසින් කසළ දැමූ ස්ථානය නාය යාම නිසා පීඩාවට පත් වූ ජනතාව විසින් රු.3,433,500 ක මුදලක් ඉල්ලා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.22,886,989 ක ප්‍රාග්ධන වියදම දරා තිබුණද සභාව විසින් ප්‍රසම්පාදන සැලස්මක් සකස් කර නොතිබුණි.

4.2 අයවැය පාලනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 3 ක සියයට 35 සිට සියයට 79 දක්වාද, වියදම් විෂයයන් 7 ක සියයට 9 සිට සියයට 78 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 16 ක් සඳහා සලසා දී තිබුණු රු.4,755,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 19 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 43 සිට සියයට 99 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

5. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) මුදල් හා බැංකු කටයුතු
(ඈ) වාහන පාලනය
(ඉ) ආදායම් පාලනය
(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ